සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# තෙවන වාර පරීක්ෂණය 2020
# Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

## පුරවැසි අධ්‍යාපනය - I

පැය එකයි
One hour

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4), යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමය වූයේ,
    (1) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි. (2) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යි.
    (3) නව ලිබරල්වාදයයි. (4) ප්‍රජාතාන්ත්‍රික සමාජවාදයයි.

02. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,
    (1) බ්‍රිතාන්‍යය ය. (2) ඔස්ට්‍රේලියාව ය.
    (3) කියුබාව ය. (4) ඇමරිකා එක්සත් ජනපදය ය.

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ සාමකාමී ජන සමාජයක් ගොඩ නැගීමට හේතුවන ලක්ෂණයක් වන්නේ,
    (1) මානව සංවර්ධනයට ප්‍රමුඛතාව හිමිවීම. (2) අපක්ෂපාතී ජනමාධ්‍යයන් පැවතීම.
    (3) නීතියේ ආධිපත්‍ය පැවතීම. (4) දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතීම

04. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරයා පත් කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
    (1) ජනාධිපතිවරයා (2) අගමැතිවරයා
    (3) ආණ්ඩුකාරවරයා (4) අගවිනිසුරුවරයා

05. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ මින් කවරක් ද?
    (1) විධායක බලය හසුරුවන්නේ ජනාධිපතිවරයා වීම.
    (2) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම.
    (3) විධායකය හා ව්‍යවස්ථාදායකය අතර සෘජු සබඳතාවක් පැවතීම.
    (4) නාමික හා සත්‍ය විධායකය යන අංග දෙකක් පැවතීම.

06. ගැටුම් නිරාකරණය සඳහා භාවිත කරන සාකච්ඡා ක්‍රමයේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
    (1) සේවක - සේව්‍ය දෙපාර්ශවයක් සිටීම.
    (2) පෞද්ගලික ගැටුම් පමණක් විසඳනු ලැබීම.
    (3) දෙපාර්ශවයටම නීතියේ ප්‍රතිපාදන අනුව තීරණ ලබා දීම.
    (4) දෙපාර්ශවයටම ජය - ජය විසඳුම් ලැබීම.

07. ජාත්‍යන්තර ආර්ථික කණ්ඩායම් පිහිටුවා ගැනීමේ මූලික අරමුණක් වන්නේ,
    (1) දියුණු රටවලින් එල්ල වන ආර්ථික බලපෑම්වලට සාමූහිකව මුහුණ දීම ය.
    (2) කලාපීය ආර්ථික සහයෝගීතාව පුළුල් කිරීම ය.
    (3) ආර්ථිකය තුළ මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් ලෙස හැසිරවීම ය.
    (4) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට එකතුවීම ය.

08. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුමට (NAFTA) අයත් සාමාජික රටවල් ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) කැනඩාව, මියන්මාරය  (2) නේපාලය, තායිලන්තය
   (3) පෘතුගාලය, ස්වීඩනය  (4) කැනඩාව, මෙක්සිකෝව

09. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අයහපත් ප්‍රතිඵලයකි,
   (1) ආර්ථික විවිධාංගිකරණය වීම.  (2) බුද්ධිගලනය වේගවත් වීම.
   (3) යටිතල පහසුකම් පුළුල් වීම.  (4) විදේශ ආයෝජන ගලා ඒම.

10. ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන වාසියක් වන්නේ මින් කවරක් ද?
   (1) මානසික ආතතිය අවම වීම.  (2) දේශපාලන අස්ථාවර බවක් ඇතිවීම.
   (3) විචාරශීලී බව හා නිර්මාණශීලීත්වය වැඩිවීම.  (4) සමාජ පරිහානිය වේගවත් වීම.

11. ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) පළාත් පාලනය හා මහා මාර්ග  (2) විදේශ වෙළඳාම හා විදේශ කටයුතු
   (3) නිවාස ඉදිකිරීම් හා මූල්‍ය කටයුතු  (4) අධ්‍යාපනය හා බදු පැනවීම

12. බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන්නේ,
   (1) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම ය.  (2) අන් ආගම් වැළඳ ගැනීම ය.
   (3) නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය අගය කිරීම ය.  (4) අන් මත නොසලකා කටයුතු කිරීම ය.

13. ගැටුම් ඇතිවීමට බලපාන ප්‍රධාන මූල ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) පුද්ගල කණ්ඩායම් හා රාජ්‍යයන්  (2) ආගමික මතවාද හා සමාජ ආර්ථික ගැටලු
   (3) මානසික තත්ත්ව හා වාර්ගිකත්වය  (4) විවිධ ප්‍රතිරූප හා මානසික තත්ව

14. යහපාලනයක් තුළ පාලකයින්ගේ වගකීමක් වන්නේ,
   (1) වංචා හා දූෂණයෙන් තොරව කටයුතු කිරීමයි.
   (2) රාජ්‍ය පාලනය දේශපාලනීකරණය කිරීමයි.
   (3) රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයට ජනතා සහභාගීත්වය නොලැබීමයි.
   (4) නිලධාරිවාදය ක්‍රියාත්මක කිරීමයි.

15. පළාත් සභාවක් සතු ප්‍රධාන කාර්යය වන්නේ,
   (1) පළාත් ප්‍රඥප්ති අනුමත කිරීමයි.
   (2) පළාත් අයවැය ලේඛනය සකස් කිරීමයි.
   (3) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණයයි.
   (4) ප්‍රඥප්ති සම්පාදනය හා සම්මත කිරීමයි.

16. ස්විස්ටර්ලන්තයේ සන්ධීය මහා මණ්ඩලය සමන්විත වන ආයතන දෙක වන්නේ,
   (1) සන්ධීය සභාව හා රාජ්‍ය සභාව ය.  (2) සෙනට් සභාව හා නියෝජිත සභාව ය.
   (3) ජාතික සභාව හා සෙනෙට් සභාව ය.  (4) ජාතික සභාව හා රාජ්‍ය සභාව ය.

17. නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට බලපා ඇති සාධකය මින් කුමක් ද?
   (1) ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම.
   (2) සියලුම පරිපාලන බලතල පළාත් පාලන ආයතන වෙත ලබාදීම.
   (3) ප්‍රදේශීය පාලකයන් පාලන කටයුතුවලට සහභාගී කර ගැනීම.
   (4) ප්‍රාදේශීය පාලන ඒකකවලට බලය පවරා දීම.

18. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවක් වන්නේ,
   (1) ජාතික ඒකාග්‍රතාවය ය.  (2) පුනරුදය ය.
   (3) කාර්මික විප්ලවය ය.  (4) නිර්මාණශීලී හැකියාවන් ය.

19. රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, පුරවැසියන් පොදු අරමුණක් කරා මෙහෙයවීමත් සිදු කරන ආයතනය
   (1) ආණ්ඩුවයි.  (2) රාජ්‍යයයි.  (3) විධායකයයි.  (4) ත්‍රිවිධ හමුදාවයි.

20. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රජය හා පෞද්ගලික යන දෙඅංශයම ක්‍රියා කරනු ලබන්නේ කවර ආර්ථික ක්‍රමයක ද?

(1) වැඩවසම් (2) ධනවාදී (3) සමාජවාදී (4) මිශ්‍ර

21. ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණය වන්නේ,

(1) අභියාචනාධිකරණය (2) ශ්‍රේෂ්ඨාධිකරණය
(3) දිසා අධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

22. A හා B ප්‍රකාශ සලකන්න.

A බරපතල අපරාධ නඩු විසඳීමේ බලය හා නාවුක අධිකරණ බලය මහාධිකරණය සතු වේ.

B 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඔම්බුඩ්ස්මන් තනතුර ඇති කරන ලදි.

මෙම ප්‍රකාශ අතුරෙන්,

(1) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (2) A හා B දෙකම සත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A හා B දෙකම අසත්‍ය වේ.

23. රටක පාලනය, නීතියේ උත්තරීතර බව අනුව සිදු කිරීම හැඳින්වෙන්නේ,

(1) නීතියේ ස්ථිරසාරතාව යනුවෙනි. (2) නීතියේ ආධිපත්‍ය යනුවෙනි.
(3) නීතියේ ස්වාධීනත්වය යනුවෙනි. (4) පරමාධිපත්‍යය යනුවෙනි.

24. ශ්‍රී ලාංකිකයනට කැබිනට් ආණ්ඩුක්‍රමයක් ලබා දුන් ආණ්ඩුක්‍රමය කුමක් ද?

(1) 1910 - කෲව් මැකලම් (2) 1921 0 මැනිං
(3) 1931 - ඩොනමෝර් (4) 1947 - සෝල්බරි

25. මහා මැතිවරණයකින් තේරී පත්වන පාර්ලිමේන්තුවේ ප්‍රථම කාර්යය වන්නේ,

(1) අගමැති පත් කර ගැනීමයි. (2) ඇමති මණ්ඩලය නම් කිරීමයි.
(3) කථානායකවරයකු පත්කිරීමයි. (4) කොමිෂන් සභා පත් කිරීමයි.

26. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් කිහිපයකි.

A මහජන වෙළඳපොළ පවත්වාගෙන යාම

B ස්ථාන මැන බේරුම් කිරීම හා අවහිරතා ඉවත් කිරීම

C පොදු කාණු ඉදි කිරීම හා අලුත්වැඩියා කිරීම

D ජල සම්පාදනය

ඉහත කාර්යයන් අතුරෙන් ''පොදු උපයෝගිතා සේවා'' යන තේමාව යටතට අයත් වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා D ය. (4) C හා D ය.

27. රාජ්‍ය බලය ක්‍රියාවට නංවන උත්තරීතර නීතිය මින් කවරක් ද?

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (2) දණ්ඩ නීති සංග්‍රහය
(3) සිවිල් නීති සංග්‍රහය (4) නීති විද්‍යාත්මක සිද්ධාන්ත

28. මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ප්‍රථමවරට ඇතුළත් කළේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද?

(1) 1931 - ඩොනමෝර් (2) 1947 - සෝල්බරි
(3) 1972 - ප්‍රථම ජනරජ (4) 1978 - දෙවන ජනරජ

29. මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මානව අයිතිවාසිකම් විශ්වීය සංකල්පයක් වේ.
(2) සියලුම මානව හිමිකම් මූලික නීතියට ද ඇතුළත් වේ.
(3) මානව අයිතිවාසිකම් සමානාත්මතා මූලධර්මය මත පදනම්ව ඇත.
(4) මිනිසත් බව ලැබීම හේතුකොටගෙන උපතින්ම හිමි වේ.

30. මානව සංවර්ධන දර්ශකය සැකසීමට යොදාගන්නා සංරචක දෙකක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) උපතේදී ආයු අපේක්ෂාව, අධ්‍යාපනය
(2) සාක්ෂරතාව, ක්‍රය ශක්තිය
(3) ළදරු මරණ අනුපාතිකය, උපතේදී ආයු අපේක්ෂාව
(4) දළ ජාතික නිෂ්පාදිතය, සාක්ෂරතාව

31. සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵලයකි.

(1) ආහාර ජාල දාම බිඳ වැටීම. (2) සමාජ දුරාචාර අඩුවීම.

(3) පවුල් සංස්ථා බිඳ වැටීම. (4) සමාජ විරෝධී ක්‍රියා අඩු වීම.

32. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් මූලික යුතුකමක් වන්නේ,

(1) ජාතික අභිවෘද්ධිය වර්ධනය හා ජාතික සමගිය පෝෂණය කිරීම.

(2) සමාජ සිරිත් විරිත් පිළිපැදීම හා ස්වාභාවික සම්පත් රැක ගැනීම.

(3) පවතින නීතියට ගරු කිරීම හා වැඩිහිටියන්ට ගරු කිරීම.

(4) රජයට නියමිත බදු ගෙවීම හා සමාජ සිරිත් විරිත් පිළිපැදීම.

33. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, සම්මත කරගනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ

(1) භාරකාර මණ්ඩලය මගිනි. (2) මහා මණ්ඩලය මගිනි.

(3) ළමා අරමුදල මගිනි. (4) ජාත්‍යන්තර අධිකරණය මගිනි.

34. පාරිසරික ගැටලු ඇතිවීමට මුල්වන ප්‍රධානතම හේතුව වන්නේ,

(1) සම්පත් අධි පාරිභෝජනය වේ. (2) වනාන්තර විනාශ කිරීම ය.

(3) මිනිසාගේ දිළිඳුකම ය. (4) සම්පත්වලට සාධාරණ මිලක් නොලැබීම ය.

35. සංවර්ධනය වන වෙනත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දැකිය හැකි විශේෂත්වයක් වන්නේ,

(1) ආයු අපේක්ෂාව පහළ මට්ටමක පැවතීම ය.

(2) ළදරු මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම ය.

(3) දේශීය ඉතුරුම් ඉහළ මට්ටමක පැවතීම ය.

(4) ඉහළ සාක්ෂරතා මට්ටමක් පැවතීම ය.

36. පහත ''අ'' තීරුවේ සඳහන් එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන ''ආ'' තිරුවේ සඳහන් අරමුණු සමග නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | A | හදිසි ආපදාවලින් විපතට පත් වූවන්ට උපකාර කිරීම |
| 2. | ලෝක ආහාර වැඩසටහන | B | රටවල් අතර බහුපාර්ශවීය ගෙවීම් ක්‍රමයක් ඇති කර ගැනීම |
| 3. | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | C | අන්තර්ජාතික බුද්ධිය තුළින් සාමය ඇතිකර ගැනීම |
| | | D | ස්ව ශක්තිය හා ධරණීය සංවර්ධනයක් ඇති කිරීම |

(1) ACD (2) DAB (3) CBA (4) BCD

37 වර්තමාන රාජ්‍යයන්හි මූලික වශයෙන් ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම දෙක කුමක් ද?

(1) ඒකීය හා සන්ධීය ආණ්ඩු (2) ජාතික හා ප්‍රාදේශීය ආණ්ඩු

(3) පාර්ලිමේන්තු හා ජනාධිපති ආණ්ඩු (4) ඒකාධිපති හා රාජාණ්ඩු

38. විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් වන්නේ,

(1) නේටෝ (2) ආසියාන් (3) වෝර්සෝ (4) උන්ක්ටාඩ්

39. ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජය ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගයක් වන්නේ,

(1) විදේශවලින් ණය ලබාගැනීම ය. (2) කලාපීය සංගම් ඇතිකර ගැනීම ය.

(3) යටිතල පහසුකම් සංවර්ධනය ය. (4) පරිභෝජන වියදම ඉහළ නැංවීමය.

40. ශ්‍රී ලංකාවේ වාර්ෂික අයවැය පාලනය සිදුකරනු ලබන්නේ,

(1) විධායකය විසිනි. (2) ව්‍යවස්ථාදායකය විසිනි.

(3) ජනාධිපතිවරයා විසිනි. (4) මුදල් ඇමතිවරයා විසිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education, Southern Province**

තෙවන වාර පරීක්ෂණය 2020
Third Term Test, 2020

| II ශ්‍රේණිය Grade 11 | පුරවැසි අධ්‍යාපනය - II | පැය දෙකයි Two hours |
|---|---|---|

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.

(iii) නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.

(iv) ඒකීය ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(v) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධක දෙකක් ලියන්න.

(vi) පරිවර්තන (වෙළඳපොළ) ආර්ථිකයන්හි දැකිය හැකි මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(vii) ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වා දුන් ප්‍රගතිශීලී යෝජනා දෙකක් ලියන්න.

(viii) මානව අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(ix) පරිසරයෙන් ලැබෙන ජීව උපකාරක සේවාවන් දෙකක් නම් කරන්න.

(x) ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල දෙකක් ලියන්න.

(02) ''මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර රාජ්‍යයක බලය බෙදී ඇති ආණ්ඩුක්‍රම ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයන් වේ.''

(i) සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) A සන්ධීය රාජ්‍යය බිහි වීමට බලපාන සාධක තුනක් ද,

B සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග දෙකක් ද ලියන්න. (ලකුණු 05)

(03) ''යහපාලනය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.''

(i) යහපාලනයක මූලික ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සමාජ සාධාරණත්වය ගොඩනැගීම, බිඳවැටීම කෙරෙහි බලපාන හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) A බහු සංස්කෘතික ජන සමාජයක් පවතින ශ්‍රී ලංකාව තුළ යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

B ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) ''ජාතීන් අතර පවතින සහයෝගීතාව හේතුවෙන් වර්තමාන බොහෝ රාජ්‍යයන් සංවර්ධන ඉලක්ක කරා ළඟා වී ඇත.''

(i) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමට බලපෑ සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) A ජාත්‍යන්තර සබඳතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම් කරන ක්ෂේත්‍රයන් තුනක් සඳහන් කරන්න.

B ඉන් එක් ක්ෂේත්‍රයකින් ඇතිකරන බලපෑම පිළිබඳව විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) ''අනාගත පැවැත්ම සුරක්ෂිත වන අයුරින් සම්පත් පරිහරණය සඳහා යොමුවිය යුතු වේ.''

(i) සම්පත්වල ඵලදායිතාව දියුණු කිරීමට වර්තමානයේදී භාවිත වන උපාය මාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) තිරසර සංවර්ධනය පවත්වාගෙන යාම සඳහා රජය මගින් ඉටුකළ යුතු වගකීම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) A පරිසර හිතකාමී ජීවන රටාවක් පවත්වාගෙන යාම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

B ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදා දැක්විය හැකි වර්ග තුන සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) A ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් තුන සඳහන් කරන්න.

B ඉන් එක් ක්‍රියාවලියක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(07) ''මානව හිමිකම් පිළිබඳව ප්‍රජාවගේ දැනුවත් බව සමාජයේ යහ පැවැත්මට හේතු වේ.''

(i) පුද්ගලයකු සතු මානව අයිතිවාසිකම් වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව සම්මත කර ක්‍රියාත්මක කරන පනත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) A ශ්‍රී ලංකාව තුළ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

B ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(3) | 4 -(3) | 5 -(1) | 6 -(4) | 7 -(1) | 8 -(4) | 9 -(2) | 10 -(1) |
| 11-(2) | 12 -(1) | 13 -(2) | 14 -(1) | 15 -(4) | 16 -(4) | 17 -(1) | 18 -(2) | 19 -(1) | 20 -(4) |
| 21-(2) | 22 -(3) | 23 -(2) | 24 -(4) | 25 -(3) | 26 -(3) | 27 -(1) | 28 -(3) | 29 -(2) | 30 -(1) |
| 31-(3) | 32 -(1) | 33 -(2) | 34 -(1) | 35 -(4) | 36 -(2) | 37 -(3) | 38 -(4) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් 40 යි.)

## II කොටස

(01) (i) * මහජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
* අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම
* ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම
* බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම
* ජන සමාජයේ විවිධත්වය නිරූපණයට අවස්ථා සැලසීම

(ii) දේශීය නීතිය / අන්තර්ජාතික නීතිය

(iii) භූමිය / ශ්‍රමය / ප්‍රාග්ධනය / ව්‍යවසායකත්වය

(iv) * නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ ව්‍යවස්ථාදායකය වීම.
* පරිපාලන කටයුතු පහසුකර ගැනීමට බලය විමධ්‍යගත කිරීම.
* රාජ්‍යයේ ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වීම.
* ත්‍රිවිධ බලතල (ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ) මධ්‍යම ආණ්ඩුව වෙත ඒකරාශී වී තිබීම.

(v) පිහිටීම / සංක්‍රමණය / ආක්‍රමණය / වෙළඳාම සඳහා පැමිණි විවිධ ජාතීන් / ශ්‍රමිකයන් ගෙන්වා ගැනිම

(vi) * පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම
* පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම
* පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම
* ආර්ථිකය ලිහිල්කරණය

(vii) සර්වජන ඡන්දබලය / පළාත්බද නියෝජනය / විධායක කාරක සභා ක්‍රමය / රාජ්‍ය මන්ත්‍රණ සභාව

(viii) 1215 මැග්නා කාර්ටා ගිවිසුම / 1689 බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත / 1776 ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය / 1789 ප්‍රංශ විප්ලවය / 1917 රුසියන් විප්ලවය

(ix) හිරු එළිය, වාතය. ජලය

(x) ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වීම / නව රැකියා අවස්ථා ලැබීම / හදිසි අවස්ථාවලදී ආධාර උපකාර ලැබීම / තාක්ෂණික දැනුම හුවමාරු කරගත හැකි වීම / සංවර්ධන කටයුතු සඳහා සහයෝගය ලැබීම

(02) (i) ඔස්ට්‍රේලියාව, ස්විස්ටර්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව

(ii) පරිපාලන තීන්දු ගැනිම පහසුවීම / ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම / රාජ්‍යයන් අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළකීම / විවිධත්වය තුළ ජාතිකත්වයක් ගොඩනගා ගත හැකි වීම

(iii) A ජාතික ආරක්ෂාව / විදේශ වෙළඳාම හා විදේශ කටයුතු / භූමියේ විශාලත්වය / වාර්ගික විවිධත්වය / සංස්කෘතික විවිධත්වය

B * ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම
* සියලු ජන කොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම
* මූල්‍යමය සම්පත් සාධාරණ ලෙස ප්‍රාන්ත ආණ්ඩු වෙත බෙදාහැරීම (ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) * දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
* මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
* අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
* විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීම
* නිදහස හා සාධාරණත්වය තහවුරු කිරිම ආදී (10 ශ්‍රේණිය පෙළ පොත 64 පිටුව)

(ii) * අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම
* නිලධාරිවාදය
* අල්ලස හා දූෂණය ඉහළයාම
* රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම
* රාජ්‍ය පාලනයේ ආකාරක්ෂම බව
* පෞද්ගලික අංශය ජාතික අභිලාෂ නොතකා හැරීම

(iii) * නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත් වීමට පුරුදු වේ.
* එකිනෙකාට ගරුකිරීමට හුරුවේ.
* ජනතාව සහජීවනයෙන් කටයුතු කරයි.
* විවිධ ජන වර්ග අතර විශ්වාසය තහවුරු වේ.
* විනිවිද භාවයෙන් යුතුව කටයුතු කරයි. (මින් එකක් විස්තර කිරීම) (ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) රාජ්‍ය උපාය සම්බන්ධතා / යුධ උපාය සම්බන්ධතා

(ii) සම්පත් විසංතුලනය / අතිරික්ත නිෂ්පාදන අළෙවි කරගත හැකිවීම / අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම / ප්‍රවාහන හා සංනිවේදන දියුණුව / දියුණු තාක්‍ෂණය ලබාගත හැකි වීම / හදිසි ආපදා හා විපත්වලදී සහාය ලැබීම... ආදී

(iii) * ජාත්‍යන්තර වෙළඳාම
* ණය හා ආධාර ලබාගැනීම
* ජාතික ආරක්ෂාව
* ආර්ථික ක්ෂේත්‍රය
* රැකියා සැපයීම ආදී ක්ෂේත්‍ර වලින් එකක් කෙරෙහි ඇතිකරන යහපත් හා අයහපත් බලපෑම විස්තර කිරීම (ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) 3R - සංකල්පය — 5S - ඵලදායිතා සංකල්පය
GP - හරිත ඵලදායීතාව — CP - සුපිරිසිදු නිෂ්පාදනය
TQM - පූර්ණ ගුණාත්මක කළමනාකරණය — Poka Yoke - වැරදි ශුන්‍ය කිරීම

(ii) * පරිසර නීති රීති සම්පාදනය හා බලගැන්වීම
* පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදනය දිරිගැන්වීම
* පරිසර ආරක්‍ෂණ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම
* පාරිසරික බලපෑම් තක්සේරු කිරීම
* පරිසර ආරක්‍ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම
* හරිතාගාර වායු විමෝචනය පාලනය

(iii) * නිසිලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
* පරිසර හිතකාමී ආකල්ප වර්ධනය
* පරිසර හිතකාමී භාණ්ඩ පරිහරණය
* පරිසර නීතිරීතිවලට අනුගත වීම
* භෞතික පරිසරයට හානි නොකිරීම .... ආදී ගැලපෙන පිළිතුරු (ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) ප්‍රාග්ධන සූක්ෂමය / ශ්‍රම සූක්ෂමය (මින් දෙකක්)

(ii) පාරිභෝගික භාණ්ඩ / අන්තර් භාණ්ඩ / ප්‍රාග්ධන භාණ්ඩ

(iii) නිෂ්පාදනය / බෙදාහැරීම / පරිභෝජනය (මින් එක් කරුණක් විස්තර කිරීම) (ලකුණු 2 + 3 + 5 = 10)

07 (i) සිවිල් අයිතිවාසිකම් / දේශපාලන / සමාජයීය / ආර්ථික / සංස්කෘතික (මින් දෙකක්)

(ii) * සාප්පු හා කාර්යාල සේවක පනත
* ප්‍රසූති ආධාර ආඥා පනත
* කාර්මික ආරවුල් පනත
* පඩිපාලක සභා ආඥා පනත
* සේවක අර්ථ සාධක අරමුදල් පනත (මින් තුනක්)

(iii) * ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පැතීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවස්ථාව සලසා දීම
* ඔම්බුඩ්ස්මන් පරිපාලන කටයුතු පිළිබඳ (පාර්ලිමේන්තු කොමසාරිස්වරයා) මගින් කටයුතු කිරීම
* මානව හිමිකම් කොමිසම මගින් කටයුතු කිරීම
* පුරවැසියන් දැනුවත් කිරීමට කටයුතු කිරීම
* විෂය නිර්දේශ මගින් ශිෂ්‍ය ප්‍රජාව
* විශේෂ පුහුණු පාඨමාලා සංවිධානය

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




මිට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

